# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# පොල් වගාකිරීමේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

**පොල් වගාකිරීමේ මණ්ඩලය පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**තනතුර : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි**
**(පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ)**
**සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සමඟ මානව සම්පත් කළමනාකරණ / කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකු වීම හෝ මානව සම්පත් / කළමනාකරණ ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සමඟ

පිළිගත් ආයතනයක වසර 15ක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකාර (Managerial) මට්ටමේ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් කාණ්ඩය : HM 1-1
වැටුප් පරිමාණය : රු.80,295/- (2,270x15) – 114,345/-
වයස : අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තනතුර : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති හා සංවර්ධන)**
**සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධියක් සමඟ කෘෂිකර්ම විද්‍යාව/ කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකු වීම/ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

සමඟ

පිළිගත් ආයතනයක වසර 15 ක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකාර (Managerial) මට්ටමේ සේවා පළපුරුද්දක් ලබා තිබීම

වැටුප් කාණ්ඩය : HM 1-1
වැටුප් පරිමාණය : රු. 80,295/ - (2,270x15) 114,345/-
වයස : අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ)**
**සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණ/ ව්‍යාපාර පරිපාලන/ වාණිජවේදී උපාධියක් සමඟ ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධිය හෝ පිළිගත් වරලත් වෘත්තිය ගණකාධිකාරිආයතනයක (ICA/CIMA/ACCA/වෙනත්) ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

සමඟ

පිළිගත් ආයතනයක වසර 15 ක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකාර (Managerial) මට්ටමේ සේවා පළපුරුද්දක් ලබා තිබීම

වැටුප් කාණ්ඩය : HM 1-1
වැටුප් පරිමාණය : රු. 80,295/ - (2,270x15) 114,345/-
වයස : අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය) IIශ්‍රේණිය**
**සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/ වාණිජ්‍ය විශේෂ උපාධිධාරියෙකු වීම හා කළමනාකාර (Managerial) මට්ටමේ වසර 03 ක අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද

වැටුප් කාණ්ඩය : MM 1-3
වැටුප් පරිමාණය :රු. 55,925/ - (1,375x10) (1,910x15) 98,325/-
වයස : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : විෂයානුබද්ධ විශේෂඥ (පුහුණු) II ශ්‍රේණිය**
**සේවා ස්ථානය:පොල් සංවර්ධන පුහුණුමධ්‍යස්ථානය(ලුණුවිල) – තනතුරු 01**

සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දෙවනපෙළ සාමාර්ථයක් සහිතව ලබාගත් විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධිය.

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 03 ක සේවා පළපුරුද්

වැටුප් කාණ්ඩය : MM 1-1
වැටුප් පරිමාණය : රු.53,175/ -(1,375x10) (1,910x15) 95,575/-
වයස : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : ණය කළමනාකරණ නිලධාරි II ශ්‍රේණිය**
**සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

සුදුසුකම් හා පළපුරුද්ද :

ගණකාධිකරණ විෂය සහිතව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක්/ පිළිගත් වරලත් වෘත්තිය ගණකාධිකාරි ආයතනයක මධ්‍යම පරීක්ෂණය සමත්වීම/ ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම

සමඟ

රාජ්‍ය/ සංස්ථා හෝ රජය පිළිගත් ආයතනයක ගිණුම් කටයුතු පිළිබඳ වසරක සේවා පළපුරුද්ද

වැටුප් කාණ්ඩය : JM 1-2
වැටුප් පරිමාණය :රු. 43,355/ - (755x10) (1,135x18) 71,335/-
වයස : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම

**තනතුර : මෙහෙයුම් නිලධාරි II ශ්‍රේණිය**
**සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජෛවමිතිය/ ජෛව සංඛ්‍යානය/ ව්‍යාපෘති ඇගයීම/ ගණිතය/ සංඛ්‍යානය යන විෂයන්ගෙන් එකක්, ප්‍රධාන විෂයක් සහිතව ලබාගත් විද්‍යාවේදී කෘෂිකර්ම උපාධියක් ලබා තිබීම

සමඟ

රාජ්‍ය/ මණ්ඩල/ සංස්ථා හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ව්‍යාපෘති මෙහෙයුම් හා ප්‍රගති පාලන කටයුතු පිළිබඳ වසරක සේවා පළපුරුද්ද

වැටුප් කාණ්ඩය : JM 1-2
වැටුප් පරිමාණය :රු. 43,355/ - (755x10) (1,135x18) 71,335/-
වයස : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : විෂයානුබද්ධ නිලධාරි (කෘෂි ඉජිනේරු, ජල කළමනාකරණ සහ පිරිසැකසුම්) IIශ්‍රේණිය**
**සේවා ස්ථානය :පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය(ලුණුවිල)**
**තනතරු - 01**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

කෘෂි ඉංජිනේරු විද්‍යාව විෂයට විශේෂිතව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධියක්

සමඟ

රාජ්‍ය/ මණ්ඩල/ සංස්ථා හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පුහුණු/ අධ්‍යයන/ පර්යේෂණ/ ව්‍යාප්ති කටයුතු පිළිබඳ වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම

| | |
|---|---|
| වැටුප් කාණ්ඩය | : JM 1-2 |
| වැටුප් පරිමාණය | :රු. 43,355/ - (755x10) (1,135x18) 71,335/- |
| වයස | : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ |

**තනතුර : කාර්මික නිලධාරි IIශ්‍රේණිය**
**සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී ඉංජිනේරු (සිවිල්) උපාධියක්

හෝ

II. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

හෝ

III. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සමඟ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක/ මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

IV. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සමඟ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක/ මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 10 ක පළපුරුද්දක් ලබා තිබීම

| | |
|---|---|
| වැටුප් කාණ්ඩය | : JM 1-2 |
| වැටුප් පරිමාණය | :රු. 43,355/ - (755x10) (1,135x18) 71,335/- |
| වයස | : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ |

**(උක්ත තනතුරු සඳහා ජීවන වියදම් දීමනාව රු.17,800/- ඇතුළු තනතුරට අදාළ රජයේ අනෙකුත් දීමනා හිමි වේ.)**

**වෙනත් කොන්දේසි :-**

**සෑම ඉල්ලුම්කරුවෙක් ම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- ඒ අනුව 2025.01.17 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් සුදුසු ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකළ යුතුවේ. එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේනම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වේ.
- සියලුම අයදුම්පත් 2025.01.17 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සළකා කටයුතු කරනු ලැබේ.

සභාපති
පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

ඉහත තනතුරු සඳහා අදාළ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි. එමෙන්ම එසේ බාගත කරගැනීමේ යම් අපහසුතාවයක් ඇති වුවහොත් තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකරන ලෙස දන්වමි.
https://coconutsrilanka.lk/